විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

NERDC

# විදුලි කාර්මික සහ විදුලි/විද්‍යුත් කාර්මික තනතුරු සඳහා බඳවා ගැනීම

## (කොන්ත්‍රාත් පදනම මත)

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පවතින දිවයිනේ ප්‍රමුඛතම ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනය වන ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, ජාතික අවශ්‍යතා මත පදනම්ව මූලිකව ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති, වාණිජ ව්‍යාපෘති සහ කර්මාන්ත සඳහා සේවා සැපයීම සිදුකරනු ලැබේ.

අප මධ්‍යස්ථානයේ පුරප්පාඩුව පවතින විදුලි කාර්මික සහ විදුලි/විද්‍යුත් කාර්මික තනතුරු සඳහා මාස 06 ක කාලයකට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට පහත සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යාපන සුදුසුකම් :**

- විෂයන් 02 කට සම්මාන සාමාර්ථ සමග විෂයන් 06 ක් සහිතව අ.පො.ස. (සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම.

**වෘත්තීය සුදුසුකම් :**

- තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු සුදුසුකමක් ලබා තිබීම.

**අවශ්‍ය නිපුණතා :**

- විදුලි සහ විද්‍යුත් (ඉලෙක්ට්‍රිකල් සහ ඉලෙක්ට්‍රොනික්) ක්ෂේත්‍රයේ ප්‍රායෝගික අත්දැකීම් හා දැනුම තිබීම.

**අනෙකුත් අවශ්‍යතා :**

- වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිවෙත් පිළිබඳව මනා දැනුමක් තිබීම.
- ක්ෂේත්‍ර තත්වයන් යටතේ ස්වාධීනව වැඩ කිරීමේ හැකියාව.
- සන්නිවේදන හැකියාව සහ අදාළ වාර්තා සකස්කිරීමේ හැකියාව.
- අවශ්‍ය අවස්ථාවලදී වැඩි පැය ගණනක් වුවද වැඩ කිරීමට ඇති කැමැත්ත.
-

**රාජකාරී සහ වගකීම් :**

**විදුලි කාර්මික**

- ප්‍රමිතීන් සහ රෙගුලාසි වලට අනුකූලව විදුලි රැහැන් ඇදීම සිදු කිරීම.
- විදුලි ස්ථාපනයන් පරීක්ෂා කිරීම, දෝෂ සොයා ගැනීම සහ අළුත්වැඩියා කිරීම.
- විදුලි මෝටර් සහ පාලන පද්ධති අළුත්වැඩියා කිරීම සහ සේවා කිරීම.
- ඉලෙක්ට්‍රානික පාලන පද්ධති ස්ථාපනය, සේවා කිරීම, අළුත්වැඩියා කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම සහ ස්වීච් ගියර් ආරක්ෂා කිරීම.
- විදුලි/විද්‍යුත් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන පරීක්ෂණ කටයුතු සඳහා සහායක සේවා සැපයීම.

**විදුලි/විද්‍යුත් කාර්මික**

- විදුලි/ විද්‍යුත් උපකරණ සහ වැඩ සඳහා , සේවා සැපයීම, අළුත්වැඩියා කිරීම සහ ගැටළු නිරාකරණය කිරීම.
- PCB ඇඳීම් කිරීම සහ සකස් කිරීම.
- ඉලෙක්ට්‍රානික/ විදුලි පරිපථ සහ පරිපථ පුවරු නිෂ්පාදනය කිරීම.
- විදුලි/ ඉලෙක්ට්‍රානික සංරචක සහ පද්ධතිවල ගැටළු නිරාකරණය කිරීම සහ අළුත්වැඩියා කිරීම.

වැටුප - රු. 40,834/- (ක. සේ. ච. 01/2025 අනුව)

**අනෙකුත් ප්‍රතිලාභ:**

- රු.17,800/- ක ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.
- සේවක අර්ථසාධක අරමුදල සඳහා 15% ක ආයතනයේ දායකත්වය සහ 10% ක සේවකයාගේ දායකත්වය.
- සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා 3% ක ආයතනයේ දායකත්වය.
- සේවා අවශ්‍යතාවය අනුව අමතර වැඩ කිරීම වෙනුවෙන් අතිකාල දීමනා ගෙවනු ලැබේ.

**වයස් සීමාව :**

- අවුරුදු 18 - 45 අතර විය යුතුය.

**අයදුම්පත් යොමු කිරීම :-**

ඔබගේ විස්තරාත්මක ජීව දත්ත තොරතුරු, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ විස්තර (නම්, ලිපිනයන්, දුරකථන අංක) ද සහිතව අදාළ සහතිකපත් වල පිටපත් සමගින්, අධ්‍යක්ෂ (මානව සම්පත්), ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, කාර්මික ජනපදය, ඒකල, ජා ඇල යන ලිපිනයට **<u>2026 මාර්තු 20 දිනට පෙර</u>** ලියාපදිංචි තැපැලෙන් **යොමු කරන්න.** නැතහොත් ආයතනයට පැමිණ බාර දීමට කටයුතු කරන්න.
(අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ කොටසේ වම් කෙළවරේ සඳහන් කරන්න.)

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
2පී/17බී, කාර්මික ජනපදය,
ඒකල , ජා ඇල.

**දු.ක. : 0112 236 284, 0112 236 384, 0112 236 307**

වෙබ් පිටුව : www.nerdc.lk
2026.03.04